# රෝටවයිරස් (Rotavirus)

ප්‍රතිශක්තිකරණ තොරතුරු

## රෝටවයිරස්

රෝටවයිරස් මගින් ගැස්ට්‍රොඑන්ටරයිටිස් ආකාරයේ දරුණු බෝවන රෝගයක් ඇති කෙරේ. සමහර අය මේ සම්බන්ධ රෝග ලක්‍ෂණ නොපෙන්වන අතර, බාල ළමුන් විසින් සාමාන්‍ය පාචනය සිට රෝහල්ගත කිරීම අවශ්‍ය මරණයට තුඩුදිය හැකි ජීවිත තර්ජන ඇති කරන විජලනය වන පාචනය දක්වා දරුණු රෝග ලක්‍ෂණ පෙන්වීමට බොහෝසේ ඉඩකඩ ඇත.

2007 දී  ජාතික රෝටවයිරස් එන්නත් වැඩසටහනක් ආරම්භ කල අතර ඒ මගින් වසරකට රෝහල්ගත කරන ප්‍රමානය 7,000 කට වැඩි සංඛ්‍යාවකින් අඩුවී ඇති බව ගණන් බලා ඇත. රෝහල වෙත යන අය වුවද අඩුවශයෙන් රෝගය හේතුවෙන් බලපෑමට ලක්වූ අයවේ.

ප්‍රතිශක්තිකරණය ලබාදීම මගින් ඔබගේ බිලිදා හට රෝටවයිරස් මගින් ඇතිවන අවදානම අඩුකර ගත හැකිය. සියළුම දරුවන් විසින් මෙම එන්නත ලබාගත යුතුය. ඔවුන් හට ප්‍රතිශක්තිකරණය ලබා නොදුනහොත්, ඔවුන්ගේ ආහාර, ජලය, හෝ අත් ආසාදනයවුනු අයෙකුගේ අසූචි සමග සම්බන්ධවුවහොත් ඔවුනට රෝටවයිරස් වැළදිය හැකිය.

එන්නත මගින් දරුණු අතුරු ආබාධ හෝ දරුණු අසාත්මිකතාවයන් ඇතිවීම විරළය. ඔබගේ දරුවා විසින් කිසිම එන්නතකට දරුවාගේ ප්‍රතිචාරය සම්බන්ධයෙන් කනස්සල්ලක් ඇතිනම්, වහාම ඔබගේ වෛද්‍යවරයා හමුවන්න.

## රෝටවයිරසයට එරෙහි ප්‍රතිශක්තිකරණය

ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන යටතේ රෝටවයිරසයෙන් නොමිළේ ආරක්‍ෂාව ලබාදේ. වික්ටෝරියා ප්‍රාන්තයේ බිලිඳුන් හට රෝටවයිරසයට එරෙහිව ප්‍රතිශක්තිකරණය නොමිළේ ලබාදේ. මෙය වයස මාස දෙකේදී සහ හතරේදී මාත්‍රා දෙකක් වශයෙන් කටින් ලබාදේ. පළමු මාත්‍රාව බිලිදා සති 14යි දින හයකින්ද, දෙවන මාත්‍රාව බිලිදාට සති 24 යි දින හයකින්ද ලබාදිය යුතුය.

මෙම එන්නත මගින් වෙනත් ආකාරයේ පාචනයට ආරක්‍ෂාව ලබා නොදුන්නද, රෝටවයිරස් මගින් ජීවිතයට තර්ජන ඇති කරන පාචනයට ඇති අවදානම අඩු කරනු ඇත.

## ප්‍රතිශක්තිකරණයට පෙර අවශ්‍ය සෝදිසි ලැයිස්තුව

එන්නත ලබාගැනීමට පෙර ඔබගේ බිළිඳා සම්බන්ධයෙන් පහත දේ අදාල නම් ඔබගේ වෛද්‍යවරයා වෙත දැනුම් දෙන්නඃ

- මාත්‍රාවලින් එකකට හෝ නිර්දේශ කල වයසට වැඩිනම්
- අසනීපනම් (උෂ්ණත්වය 38.5°C වඩා වැඩිනම්)
- කිසියම් එන්නතකට දරුණු ප්‍රතිචාරයක් ඇතිකර තිබුණේ නම්
- කිසියම් දෙයකට දරුණු අසාත්මිකතාවයක් ඇතිනම්
- අන්තරස්ථාපනයට (intussusception ) තුඩුදෙන අන්තරස්ථාපනය හෝ උපතින් ඇතිවූ අසාමාන්‍යතාවයක් ඇතිනම්
- ස්ටෙරොයිඩ සහිත බෙහෙත් ගන්නේ නම්
- රුධිර පාරවියලනයක් හෝ රුධිර සහිත දෙයක් සිරුරට ලබා දුනි නම්
- ප්‍රතිශක්ති ක්‍රම ඌනතාවය, රුධිරයේ අසාමාන්‍ය තත්වයක්, පිළිකා, එච්.අයි.වී. හෝ සමහර බෙහෙත් හේතුවෙන් ප්‍රතිශක්තිය හීනවී ඇතිනම්
- ඔබගේ නිවසේ කිසිවෙකුගේ ප්‍රතිශක්තිය හීනවී ඇතිනම්.

## රෝටවයිරස්හි අතුරු ආබාධ

සියළුම බෙහෙත්වල අනවශ්‍ය අතුරු ආබාධ තිබුණද, රෝටවයිරසයට එරෙහි එන්නත ඵලදායී සහ ආරක්‍ෂාකාරීවේ.

VICTORIA State Government | Health and Human Services

අතුරු ආබාධ අතර පහතදේ ඇත:

- එන්නතට පසුව බිලිඳුන්ගේ අසූචිවල රෝටවයිරසය තිබිය හැකිය. නැපී මාරුකල පසු අත් හොඳින් සෝදා ගැනීම සැමවිටම නිර්දේශ කෙරේ. තවද අඩු ප්‍රතිශක්තිකරණය ඇති අය මෙම කාලයේදී කිලිටිවූ නැපි භාවිතයෙන් වැලකිය යුතුය.

## ප්‍රතිශකතිකරණයෙන් ඇතිවන විරළ අතුරු ආබාධ

ඕනෑම එන්නතක් මගින් දරුණු අසාත්මික ප්‍රතික්‍රියාවක් (ඇනෆිලැක්සිස්) ඇතිවීමේ ඉතා අඩු අවදානමක් ඇත. මේ හේතුව නිසා වැඩිදුර ප්‍රතිකාර අවශ්‍යවුවහොත් ප්‍රතිශක්තිකරණය ලබාදීමෙන් පසු අවම වශයෙන් මිනිත්තු 15ක් වත් සායනයේ හෝ වෛද්‍ය ශල්‍යාගාරයේ රැඳී සිටින ලෙස ඔබට අවවාද කෙරේ.

රෝටවයිරස් එන්නතේ පළමුවන හෝ දෙවන මාත්‍රාව ලබාදීමෙන් සති තුනකට පසුව බිලිඳුන් හට අන්තරස්ථාපනය (ටෙලස්කෝපයක කැබලි මෙන් බඩවැලේ එක පසක සිට බඩවැල් අනෙක් පසට බඩවැල් යාම මගින් අවහිරයක් ඇතිවීමට හැකියාව ඇත) සිදුවිය හැකිය (ඉතා විරල අවස්ථාවල). බිලිදකු හට අන්තරස්ථාපනය ඇති බවට ඇති රෝග ලක්‍ෂණ අතර පහතදේ තිබිය හැකිය:

- කිහිප වාරයකදී හැඬීම
- සුදුමැලි පෙනුම
- දෙපා උදරය දෙසට ඉස්සීම

මෑතකාලීන ඕස්ට්‍රේලියානු සහ විදේශ අධ්‍යයනයන් මගින් යෝජනා වන්නේ පළමුවන සහ දෙවන රෝටවයිරස් මාත්‍රාව ගත් දිනට පසු සති තුනකින් බිලිඳුන් අතර අන්තරස්ථාපනය ඇතිවීමේ වැඩි අවදානමක් ඇති බවයි. එන්නත් කල බිලිඳුන් 100,000 කින් අමතර 4 දෙනෙකුට අන්තරස්ථාපනය ඇතිවීමේ අවදානමක් ඇත. නැතහොත් ඕස්ට්‍රේලියාවේදී වසරකට එන්නත් කරන දරුවන්ගෙන් අමතර බිලිඳුන් 14 දෙනෙකුට අන්තරස්ථාපනය ඇතිවේ.

## උපකාර ලබා ගත හැකි ස්ථාන

- ඔබගේ වෛද්‍යවරයා
- ඔබගේ පළාත්පාලන ආයතන ප්‍රතිශක්තිකරණ සේවාව
- බෙටර් හෙල්ත් චැනල් (Better Health Channel) https://www.betterhealth.vic.gov.au/health/healthyliving/rotavirus-immunisation

මෙම ප්‍රකාශනය කියවිය හැකි ආකාරයට ලබා ගැනීම සඳහා, අවශ්‍යනම් ජාතික රිලේ සේවාව (National Relay Service) වන 13 36 77 උපයෝගී කරගෙන දුරකථන අංක 1300 882 008 අමතන්න, නැතිනම් immunisation@dhhs.vic.gov.au වෙත ඊමේල් පණිවුඩයක් යවන්න.

බලය ලබාදී ප්‍රකාශයට පත්කලේ හි 1 Treasury Place, Melbourne වික්ටෝරියානු රජය මගින්.

© වික්ටෝරියානු රජය, සෞඛ්‍යය සහ මානව සේවා දෙපාර්තමේන්තුව ජුනි 17.